// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2370/12 - 2024 පෙබරවාරි මස 07 වැනි බදාදා - 2024.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 94/47 (viii)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින්,

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "දඹදෙණිය ශ්‍රී විජයසුන්දරාරාම රජමහා විහාරය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත්කරනු ලැබේ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබූ "දඹදෙණිය ශ්‍රී විජයසුන්දරාරාම රජමහා විහාරය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 පෙබරවාරි මස 06 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**දඹදෙණිය ශ්‍රී විජයසුන්දරාරාම රජමහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹදෙණි හත්පත්තු සුළු කොට්ඨාසයේ, අංක 1042, දඹදෙණිය දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දඹදෙණිය (අ.ග.පි. 556) ග්‍රාමයේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ 2023 ජූලි මස 10 දිනැති අංක KU/NRM/2023/173 දරන අනුරේඛනයේ කැබලි අංක ඒ, බී, සී සහ ඩී වන පන්සල්වත්ත නමැති ඉඩමේ හෙක්ටයාර් 4.4503 ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය.

1A - G 41377 — 16 (2024/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැබලි අංක ඒ - පන්සල්වත්ත ඉඩම, හෙක්ටයාර 0.0237 (අ.0 රූ.0 පර්.9.4)**

*උතුරට* : ඩබ්ලිව්. එම්. පත්මාකාන්ති හිමිකම් කියන පන්සල්වත්ත සහ පාර

*නැගෙනහිරට* : බී වැනි බිම් කැබැල්ල

*දකුණට* : බී වැනි බිම් කැබැල්ල

*බටහිරට* : ඩබ්ලිව්. එම්. පත්මාකාන්ති හිමිකම් කියන පන්සල්වත්ත

**කැබලි අංක බී - පන්සල්වත්ත ඉඩම, හෙක්ටයාර 0.3395 (අ.0 රූ.3 පර්.14.2)**

*උතුරට* : ඩී වැනි බිම් කැබැල්ල, ඒ රම්‍යලතා හිමිකම් කියන පන්සල්වත්ත, බී.ඒ. කරුණාරත්න හිමිකම් කියන පන්සල්වත්ත, ජේ.එම්.ඩී.එන්. ජයලත් හිමිකම් කියන පන්සල්වත්ත, ඩබ්ලිව්. මාලනී හිමිකම් කියන පන්සල්වත්ත, ජේ.ඒ.එස්.ජී. ජයකොඩි හිමිකම් කියන පන්සල්වත්ත පාර, ඩබ්ලිව්.එම්. පත්මාකාන්ති හිමිකම් කියන පන්සල්වත්ත, ඒ වැනි බිම් කැබැල්ල, පාර, ඩබ්ලිව්.එම්. තිලකරත්න හිමිකම් කියන පන්සල්වත්ත සහ සී වැනි බිම් කැබැල්ල.

*නැගෙනහිරට* : සී වැනි බිම් කැබැල්ල

*දකුණට* : සී වැනි බිම් කැබැල්ල සහ මාර්ගය (ප්‍රාදේශීය සභා)

*බටහිරට* : මාර්ගය (ප්‍රාදේශීය සභා)

**කැබලි අංක සී - පන්සල්වත්ත ඉඩම, හෙක්ටයාර 3.9166 (අ.9 රූ.2 පර්.28.5)**

*උතුරට* : බී වැනි බිම් කැබැල්ල, පාර සහ ඩබ්ලිව්.එම්. තිලකරත්න හිමිකම් කියන පන්සල්වත්ත

*නැගෙනහිරට* : ඩබ්ලිව්.එම්. තිලකරත්න හිමිකම් කියන පන්සල්වත්ත, ජී. මල්ලිකා රූපනන්දනී හිමිකම් කියන පන්සල්වත්ත, මනෝ ජයලත් හිමිකම් කියන පන්සල්වත්ත, ජී.ඒ. සුනේත්‍රා ප්‍රියංගනී හිමිකම් කියන පන්සල්වත්ත සහ පාර.

*දකුණට* : පාර සහ මාර්ගය (ප්‍රාදේශීය සභා)

*බටහිරට* : මාර්ගය (ප්‍රාදේශීය සභා), බී වැනි බිම් කැබල්ල සහ පාර

**කැබලි අංක ඩී - පන්සල්වත්ත ඉඩම, හෙක්ටයාර 0.1705 (අ.0 රූ.1 පර්.27.4)**

*උතුරට* : රත්නප්‍රිය හිමිකම් කියන යකඩවලහේන සහ විල්සන් සමරනායක හිමිකම් කියන පන්සල්වත්ත

*නැගෙනහිරට* : විල්සන් සමරනායක හිමිකම් කියන පන්සල්වත්ත, ඒ. රම්‍යලතා හිමිකම් කියන පන්සල්වත්ත සහ බී වැනි බිම් කැබැල්ල

*දකුණට* : බී වැනි බිම් කැබැල්ල සහ මාර්ගය (ප්‍රාදේශීය සභා)

*බටහිරට* : මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ රත්නප්‍රිය හිමිකම් කියන යකඩවලහේන

ඉහත ඉඩම තවදුරටත් ශ්‍රී ලංකා ජාතික ඛණ්ඩාංක පද්ධතියට (SLD 99) අනුව පහත සඳහන් ඛණ්ඩාංක වලින් ආවරණය වන, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.4503ක් (අ.10, රූ.3, පර්.39.5) ක් වූ ප්‍රාදේශයක් ලෙස විස්තර කර ඇත.

| | X,Y ඛණ්ඩාංක | | |
|---|---|---|---|
| උතුර | 7024(540311.614. උ,430971.258නැ) | පැළ ඉණි වැට | 7025(540323.736. උ,430987.028නැ) |
| | කම්බි වැට | 7026(540299.379. උ,430998.439නැ) | කම්බි වැට |
| | 7027(540260.226. උ,431031.488නැ) | කම්බි වැට | 7028(540247.275. උ,431047.679නැ) |
| | පැළ ඉණි වැට | 7029(540254.073. උ,431066.274නැ) | පැළ ඉණි වැට |
| | 7030(540258.847. උ,431076.820නැ) | පැළ ඉණි වැට | 7031(540263.775. උ,431087.401නැ) |
| | පැළ ඉණි වැට | 7000(540278.817. උ,431116.590නැ) | පැළ ඉණි වැට |
| | 7001(540286.017. උ,431l29.505නැ) | පාර | 7002(540289.305. උ,431134.009නැ) |
| | කම්බි වැට | 7003(540323.791 උ.431201.578නැ) | කම්බි වැට |
| | 7004(540343.900 උ,431238.068නැ) | පාර | 7005(540345.252 උ,431246.662නැ) |
| | මායිම් තාප්පය | මායිම් බිත්තිය | ආධාරක තාප්පය |
| | 7006(540339.870 උ,431284.363නැ) | | |
| නැගෙනහිර | 7006(540339.870 උ,431284.363නැ) | කම්බි වැට | 7007(540314.460 උ,431289.804නැ) |
| | කම්බි දැල් වැට | 7008(540287.818 උ,431296.796නැ) | මායිම් බිත්තිය |
| | 7009(540268.342 උ,431300.603නැ) | කම්බි වැට | මායිම් බිත්තිය |
| | 7010(540223.658 උ,431308.321නැ) | ගේට්ටුව | 7011(540220.123 උ,431308.001නැ) |
| | 7012(540217.906 උ,431313.130නැ) | | |
| දකුණ | 7012(540217.906 උ,431313.130නැ) | කම්බි වැට | 7013(540199.046 උ,431283.094නැ) |
| | කම්බි වැට | 7014(540183.794 උ,431266.446නැ) | කම්බි වැට |
| | 7015(540171.515 උ,431242.745නැ) | කම්බි වැට | 7016(540169.539 උ,431225.132නැ) |
| | කම්බි වැට | 7017(540137.820 උ,431127.559නැ) | කම්බි වැට |
| | 7018(540128.261 උ,431108.421නැ) | කම්බි වැට | 7019(540093.197 උ,431054.982නැ) |
| | කම්බි වැට | 7020(540093.444 උ,43l052.484නැ) | |
| බටහිර | 7020(540093.444 උ,431052.484නැ) | කම්බි වැට | 7021(540182.581 උ.431007.804නැ) |
| | කම්බි වැට | 7022(540219.711 උ,431017.457නැ) | 7023(540242.940 උ.431011.711නැ) |
| | කම්බි දැල් වැට | 7024(540311.614 උ,430971.258නැ) | |

EOG 02 - 0043

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.